

# විනිමය ඉපයිය හැකි පලතුරු

අලෙවිකරණ කාර්යයේදී එකතු කරන්නන්, ප්‍රවාහන නියෝජිතයින්, තොග වෙළඳුන් සහ සිල්ලර වෙළෙන්දන් යන අතරමැදියන් කිහිප දෙනෙක් ඊට සහභාගී වේ. ප්‍රධාන තොග වෙළඳ පොල පිහිටා ඇති නගරයට එව්මෙන් පසු බොහෝ විට පාරිභෝගිකයාට සිදු වන්නේ එම පලතුරු මිලට ගන්නා සිල්ලර වෙළෙන්දාගෙන් පරණ, හොඳ තත්වයෙන් යුක්ත නොවන පලතුරු වැඩි මිලක් ගෙවා ලබා ගැනීමටයි. ග්‍රාමීය පාරිභෝගිකයාට නම් බොහෝ විට කෙලින්ම ගොවියාගෙන් හෝ එම ද්‍රව්‍ය කෙලින්ම ලබාගත් සිල්ලර වෙළෙන්දාගෙන් මිලදී ගතහැකි අවස්ථා ඇතී නමත් නාගරික පාරිභෝගිකයාට එම වාසිය නොලැබේ. විශේෂයෙන්ම ග්‍රාමීය පොලවල් වලදී පාරිභෝගිකයාට සාධාරන මිලකට අළුත් පලතුරු මිලට ගානීමට හැකිවේ. මෙහිදී පලතුරු ප්‍රවාහනය කිරීමේ අවස්ථාවන් බොහෝ විට අඩ බැවින්ද එවිට තැලීම්, පොඩිවීම් අඩු බැවින් සහ පාරිභෝගිකයන් එම අළුත් පලතුරු වලට වැඩි කැමැත්තක් දක්වන බැවින්ද ඇත්ත වශයෙන්ම අලෙවිකරණ ගැටළු නැති තරම්ය. බොහෝ පලතුරු වලට කාලීනව ඵල හට ගන්නා ස්වභාවය නිසා ඒවා වෙළඳ පොලට එන එක්තරා කාල්ල සීමාවක් ඇති බැවින් වැඩි අස්වැන්නක් ඇති කාලයේදී විකුණා ගැනීමට වන අපහසුතා නිසා අඩු මිලකට විකිණීමට හෝ අපතේ දැමීමට සිදු වේ. අස්වැන්න ගොඩ ගැසෙන කාලයේදී මෙම අපතේ යෑම සියයට 10-20 අතර ප්‍රමාණයක් යයි සැලකිය හැක.

පසුගිය දශකය තුළ ජනගහනය වැඩිවීමත් සමග පලතුරු සඳහා වන ඉල්ලුම වැඩි වුවත් ඊට සාපේක්ෂව පලතුරු වර්ග වැඩි සංඛ්‍යාවක නිෂ්පාදන ප්‍රමාණයන් වැඩිවීමක් සිදුවී නැත. අනෙක් අතට ඉල්ලුම වැඩිවීම සහ නිෂ්පාදන වියදම වැඩිවීමත් සමග පසුගිය අවුරුදු කීපය තුළ ගොවිපලේ මිලද වැඩිවී තිබේ. අන්නාසි සහ කෙසෙල් ගෙඩි සඳහා පසුගිය අවුරුදු කීපය තුළ සාමාන්‍ය ගොවිපල මිල ගණන් පහත දැක්වෙන අයුරු වෙනස් වී ඇත. (ගෙඩියක මිල රුපියල් වලින්).

| වර්ගය | 1980 | 1981 | 1982 | 1983 | 1984 | 1985 |
|---|---|---|---|---|---|---|
| අන්නාසි (මුරුසි) | 1·97 | 2·56 | 2·98 | 4.10 | 4.64 | 4.91 |
| කෙසෙල්ගෙඩි (කෝලිකූට්ටු) | 0.47 | 0·55 | 0·58 | 0.67 | 0.75 | 0·75 |
| කෙසෙල්ගෙඩි (ඇඹුල්) | 0·28 | 0.25 | 0·25 | 0·38 | 0·28 | 0.28 |
| සිල්ලර මිල | | | | | | |
| අන්නාසි (මුරුසි) | 3.88 | 4·73 | 5·73 | 7.01 | 8.06 | 8.35 |
| කෙසෙල් (කෝලිකූට්ටු) | 0·70 | 0·84 | 0·95 | 1.10 | 1·26 | 1·20 |
| කෙසෙල් (ඇඹුල්) | 0·32 | 0·36 | 0.39 | 0.47 | 0·49 | 0·50 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

පොදුවේ පලතුරු දේශීය පරිභෝජනය සඳහා එක පුද්ගලයෙකුට සැපයෙන ප්‍රමාණය වසරකට කිලෝ 8·16 ලෙස ගණන් බලා ඇත. (1985 වසරේ ආහාර ශේෂ පත්‍රයට අනුව. රටේ මුල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දස දහස් 129·30 කි· 1981-82 ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ ආර්ථික සමීක්ෂණයට අනුව **ඒක පුද්ගල පළතුරු පාරිභෝජනය** ප්‍රමාණය මාසිකව ගෙඩි ප්‍රමාණයෙන් මෙසේය· කෙසෙල් 4·0, පැපොල් 5.7, අන්නාසි 0.6, අඹ 2.3, අලිපේර 0·1, මිදි 1.9

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පවුලක ආහාර සඳහා වැයවන මුළු මුදලින් සියයට 2 ක් පමණ මුදලක් පලතුරු සඳහා වියදම් කරයි· මෙසේ සාපේක්ෂ වශයෙන් පලතුරු සඳහා වන වියදම අඩුවීමට හේතුව ලෙස පලතුරුවල ඉහල මිල ගණන් සහ අඩු සැපයුම් ප්‍රමාණයක් සැල කිය හැක·

පලතුරු වෙළඳපොල සම්බන්ධයෙන් අපනයනය සහ දේශිය පරිභෝජනය යන අවස්ථා දෙකම සලකා ගොවියාගේ සිට අව අවසාන පාරිභෝගිකයා දක්වා ද්‍රව්‍ය ගලා එන මාර්ග සරල අයුරින් පහත දැක්වෙන සටහ නින් නිරූපනය වේ.

මෑතදී වෙළඳ හා නාවික අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ආරම්භ කරන ලද අපනයන නිෂ්පාදන ගම්මානවල පලතුරු වැවීමේ වැඩ පිළිවෙල යටතේ අපනයනය සඳහා අන්නාසි සහ වැල්දොඩම් වැවීම වඩාත් ජනප්‍රිය වී ඇත· තවද මැදපෙරදිග රටවලින් මාලදිවයින සහ යුරෝපීය රටවල් වලින් අපේ පලතුරු

**පර්යේෂණ හා පුහුණු කිරීමේ**

**නිලධාරිනී**

**රංජනී අතුකෝරල විසිනි**

සඳහා ඉල්ලුම වැඩිවී ඇත. සකස් නොකළ අළුත් පලතුරු ලෙස වැඩි ඉල්ලුමක් ඇත්තේ අන්නාසි සහ අඹවලටය· සකස් කරන ලද පලතුරු වර්ග අතර අපනයනය සඳහා වැඩි ඉල්ළුමක් ඇත්තේ වැල්දොඩම්, අන්නාසි සහ අඹවලටය· (විශේෂයෙන්ම ජෑම් සහ ජෙලි ලෙස)·

1982 වර්ෂයේදී සකස් කරන ලද පල තුරු අපනයන කළ ප්‍රමාණයෙන් සියයට 91 ක්ම වැල්දොඩම් යුෂ ලෙස ජපානය, සිංගප්පූරුව, ජර්මනිය සහ මාලදිවයින් [illegible] වල්වලටය· එමෙන්ම මැංගුස්, රඹුටන්, වරකා සහ අලිපේර වැනි අපේ කාලීන පල තුරු වර්ග වලටද විදෙස් රටවලින් ඉල්ළුමක් කඇත.

පලතුරු වෙළලපොලේ ප්‍රධාන අලෙවි කරණ ගැටළුව ලෙස අපතේ යෑම හැඳින්විය හැක· මෙම අපතේ යෑම් අඩුකර ගැනීම සහ හොඳ තත්ත්වයෙන් යුතු පලතුරු වෙළඳ පොලට ලැබෙන්නට සැලැස්වීම දේශීය ඉල්ලුම් සහ විදේශීය ඉල්ලුම වැඩි කිරීමට හේතු

වේ. මෙම හානි ඇතිවීමට හේතු ලෙස දැක්විය හැකි කරුණු කීපයකි·

1. පලතුරු හොඳින් මේරීමට පෙර අස්වනු නෙලීම (මෙය විශේෂයෙන් අලි ගැටපේර සහ අඹ අස්වනු නෙලීමේදී බලපායි)·

   අපනයනය සඳහා ඉදිරිපත් කරන අඹ තොග වලින් වැඩි කොටසක්ම අපනයන කරුවන් විසින් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථා ගැන වාර්තාවී ඇත·

2. අස්වැන්න නෙලීමේ අකාර්යක්ෂම ක්‍රම· (විශේෂයෙන්ම කෙසෙල්).

3. නිතර නිතර ඇතිවන නියඟ තත්ත්වයන් නිසා පලතුරුවල ස්වභාවය, රසය සහ පැහැයේ ඇතිවන වෙනස්කම්·

4. අසතුටුදායක ඇසිරීම්, ප්‍රවාහනයේදී දුෂ්කරතා සහ තෝරීමේ ක්‍රම·

ගොවීන් පලතුරු ඇසිරීම සඳහා බොහෝ විට යොදා ගන්නේ ගෝනි සහ ලෑලි පෙට්ටිය. ඒවායේ ඇසිරිය හැකි ප්‍රමාණයට වඩා වැඩි පුර පැටවීමෙන් සහ ලොරිවල වහලවල් මත ප්‍රවාහනය කිරීම නිසා නිසි පරිදි වාතාශ්‍රය නොලැබීම හෝ අව්වැසි ආදියට ලක්වීම නිසා හානිවීම සිදුවේ.

පලතුරු වෙළඳපොලේ සිදුවූ මෑත කාලීන වෙනස්කම් සැලකීමේදී පසුගිය වර්ෂවලට සාපේක්ෂව මෙම වර්ෂයේ සැහෙන ප්‍රමාණයකින් නිෂ්පාදනය අඩුවී ඇති බැවින් මිල ගණන් ඉහල ගොස් ඇත· අවුරුද්දේ සෑම කාලයකදීම අස්වැන්න වෙළඳපොලට ලැබුනත් පසුගිය වර්ෂයේ ජූනි/ජූලි මාසවල සිට ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල ඇතිවූ නියඟ තත්ත්වය හේතුවෙන් සැලකිය යුතු ලෙස අස්වැන්න අඩුවීමත්, ගෙඩි බාලවීමත් සිදුවිය·

දැනට අඹ, අන්නාසි සහ වැල්දොඩම් වැනි පලතුරු මෙන්ම රඹුටන්, මැංගුස්ටින් වැනි පලතුරුවල අස්වැන්න ගොඩ ගැසෙන කාලයට අපතේ යෑම් අඩු කරගත හැකි ක්‍රමයක් ලෙස සකස් කල පලතුරු නිෂ්පාදන සඳහා අපේ ආහාර තාක්ෂණ විද්‍යාඥයින්ගේ අවධානය යොමුවිය යුතු කාලය පැමිණ ඇත.

සංචාරකයින්ගෙන් විශාල ඉල්ලුමක් ඇති පලතුරු වර්ගයක් වන දූරියන් නිෂ්පාදනය අප රටේ ප්‍රදේශ කීපයකට පමනක් සීමා වී ඇත. අස්වැන්න ලැබෙන කාලයට කොළඹ සහ තදාසන්න වෙළඳපොළවල ගෙඩියක් රු· 25 - 35 වැනි මිල ගණන්වලට අලෙවි වන අතර නිෂ්පාදකයාට දූරියන් ගසකින් ආදායමක් ලබා ගැනීමට හැකිවේ· මෙම දූරියන් වගාවේ පැවැත්ම ආරක්ෂා කර ගැනීමට සහ නව දියුණු කල හැකි මාර්ග සොයා ගැනීමට අප පර්යේෂකයින් උනන්දු විය යුතුවාක් මෙන්ම සංචාරක ව්‍යාපාරය දියුණු වන විට මේ සඳහා වැඩි ඉල්ලමක් ඇති වෙළඳපොලක් බිහිවීමට ඉඩ ඇත.

අප රුපියල් දශලක්ෂ ගණන් විදේශ විනිමය වැය කරමින් මිදිවලින් සකස් කල නිෂ්පාදන ආනයනය කරනු ලබයි. නමුත් මිදි අප රටේ උතුරු ප්‍රදේශයේ හොඳින් වගා කල හැකිය· උතුරුකරයේ පසුගිය වකවානුවේ පැවති කලබලකාරී තත්ත්වය නිසාත්, ප්‍රවාහනයේ ඇතිවූ අපහසුතා නිසා කොළඹට ගෙනඒම දුෂ්කර අවස්ථාවලදී ඉතා අඩු මිලකට ගොවියාට (සමහර විට කිලෝ එක රුපියල් 5 කට පමණ) අලෙවි කිරීමට සිදු විය· අනෙකුත් පලතුරු සෑම වර්ගයකටම මෙන් වගාව වැඩිදියුණු කිරීම සඳහා පලතුරු සහනාධාර ක්‍රමයක් රජය මගින් ක්‍රියාත්මක වුනත් මිදි වගාව සඳහා එවන් සහනාධාර දීමක් දැනට ක්‍රියාත්මක වන්නේ නැත· එබැවින් ඒ සම්සම්බන්ධයෙන්ද වගාව අනෙකුත් ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීමේ පර්යේෂණ ක්‍රම පිළිබඳවද උනන්දුවීම කාලෝචිතවේ·

ආහාර තාක්ෂණඥයින්ගේ, පුද්ගලික හෝ රජයේ පලතුරු සකස් කරන ව්‍යාපාරවල, ගොවීන්ගේ, පර්යේෂකයින්ගේ, වෙලෙන්දන්ගේ සහ පාරිභෝගිකයාගේ උනන්දුව සහ අවධානය අපට හොඳ තත්ත්වයේ පෝෂණ ගුණයෙන් යුත් පලතුරු පාරිභෝජනයට ගැනීම සඳහා අත්‍යාවශ්‍ය බව මෙම කරුණු වලින් සනාථ වේ·